# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


## 2023 පෙබරවාරි මස 03 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2023.02.06 දින නිකුත් කරන ලදී)**


# ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 20.00** **තැපැල් ගාස්තුව : රු. 50.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ)

### ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී ආයතනයට සම්බන්ධව සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවාගෙන තිබූ හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ එම ආයතනය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2023 අංක  දරන ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු " සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා පුහුණු කිරීමේ හා සංවර්ධන ආයතනය " යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථාව විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ආයතනයේ සාමාජිකයන්ට, ඔවුන්ගේ විවිධ ශ්‍රේණි අනුව වෘත්තීයමය පිළිගැනීමක් ලබාදීම;

(ආ) පුහුණු කිරීමේ හා සංවර්ධන ක්ෂේත්‍රයේ නිරතවූවන්ගේ අභිරුචීන්, අභිමානය, සුබසාධනය, අයිතිවාසිකම් සහ වෘත්තීයමය තත්ත්වය උසස් කිරීම හා එය තහවුරු කිරීම;

(ඇ) දේශීය මෙන්ම විදේශීය සමාන වෘත්තීය සංවිධාන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම;

(ඈ) පොදුවේ වෘත්තියේ යහපතට තර්ජනයක් එල්ල විය හැකි ගැටලු උද්ගත වූ අවස්ථාවන් හි දී අදාළ බලධාරින් හා මැදිහත්වී ක්‍රියා කිරීම;

(ඉ) සාමාජිකයන් අතර සමාජමය කර්තව්‍යයන් ප්‍රවර්ධනය කිරීම මගින් වෘත්තීය එකමුතුතාවය තීව්‍ර කිරීම;

(ඊ) සාමාජිකයන් සඳහා වැඩ හා චර්යාව පිළිබඳ ආචාර ධර්ම හා වෘත්තීමය ප්‍රමිති පිහිටුවීම, දිරිගැන්වීම හා පෝෂණය කිරීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය හා කඩිනම් පියවර ගැනීම;

(උ) පුහුණු කිරීමේ වෘත්තීය සඳහා නියෝජිත ආයතනයක් සැපයීම හා එහි නඩත්තු සඳහා අනුග්‍රහය දැක්වීම සහ පුහුණු කිරීමේ වෘත්තීයේ යහපත හා වැඩිදියුණුව සඳහා තොරතුරු, අදහස්, ක්‍රම විධි, ශිල්පීය ක්‍රම එකතු කිරීම, සංසන්දනය කිරීම, සම්බන්ධීකරණය හා බෙදා හැරීම;

(ඌ) පුහුණු කිරීම හා සම්බන්ධ කරුණු හා ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම, අධ්‍යාපනය හා පර්යේෂණ පෝෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, දිරි ගැන්වීම හා එහිලා පහසුකම් සැලසීම සහ ඒ පිළිබඳ තොරතුරු ව්‍යාප්ත කිරීම;

(එ) ශ්‍රී ලාංකික සංවිධාන තුළ ඉගෙනුම් සංස්කෘතියක් බිහිකිරීම ධෛර්යමත් කිරීම, එය පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම;

(ඒ) සංවිධානවල කළමනාකාරිත්ව නිපුණතා මට්ටම දියුණු කිරීම අරභයා, සංවිධාන මට්ටමින් මානව සම්පත් සංවර්ධන අභිලාෂයන් ක්‍රියාකාරී අන්දමින් ප්‍රවර්ධනය කිරීම;

(ඔ) සාමාජිකයන්ට හා සාමාජිකයන් අයත් වන සංවිධානවලට ඔවුන්ගේ ශක්‍යතා වාසිදායක තරගකාරීත්වයේ උල්පතක් වශයෙන් යොදා ගැනීම උදෙසා ඒ සාමාජිකයන්ට හා සංවිධානවලට උපකාරී වීම පිණිස දැනුම් කළමනාකාරීත්වයේ ප්‍රත්‍යන්ත ගවේෂණය කිරීම;

(ඕ) පොදු වශයෙන් ආයතනයේ බලාපොරොත්තු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වූ හෝ අදාළ හෝ මඟපෙන්වන ක්‍රියාකාරීන් හෝ යම් දෙයක් හෝ කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු තත්කාලයේ බලපවත්වන රීතිවලට අනුකූලව නිලධාරින් හා එම රීතිවලට අනුකූලව තෝරාගත හැකි හා එම රීතිවලට අනුකූලව තෝරා ගන්නා ලද පුද්ගලයින්ගෙන් සමන්විත විධායක සභාවක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

(2) සංස්ථාවේ ප්‍රථම විධායක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ විධායක සභාවේ සාමාජිකත්වය දැරුවා වූ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

**5.** (1) සාමාජිකයන් බඳවා ගැනීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම, විධායක සභාවට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, විධායක සභාවේ සහ සංස්ථාවේ විවිධ නිලධාරීන්ගේ, නියෝජිතවරුන්ගේ සහ සේවකයන්ගේ රාජකාරි හැසිරවීම, සංස්ථාවේ සභා රැස්වීම්වල සහ විධායක සභා රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල සහ වෙනත් අයිතීන් පොදු වශයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණයට හා එහි අභිලාෂයන් සපුරා ගැනීමට යම් මහා සභා රැස්වීමක දී පැමිණ සිටින්නා වූ ද, ඡන්දය දීමට හිමිකම් ඇත්තා වූ ද, සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන රීති කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

සංස්ථාවේ රීති

(2) මෙම පනත ක්‍රියාත්මක වූ දිනට පෙරාතුවම වූ දිනයෙහි ක්‍රියාත්මක පැවති ආයතනයේ රීති, මෙම පනත හෝ වෙනත් ලිඛිත නීතියක් සමඟ අනනුකූල නොවනතාක් දුරට මෙම වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සැලකිය යුතු අතර, මෙම පනත යටතේ පනවනු ලබන රීති මගින් ඒවා වෙනස් කිරීම, ඒවාට එකතු කිරීම, සංශෝධනය කිරීම, අවලංගු කිරීම හෝ මෙම පනත යටතේ සාදනු ලබන රීති ප්‍රතිෂ්ඨාපනය කිරීම කළ හැකි වන්නේ ය.

(3) සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ එහිදී ඡන්දය පවිච්චි කරන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක ඡන්දයකින් හැර දැනට සංස්ථාවේ පවත්නා රීති හෝ මින්මතු පනවනු ලබන රීති වෙනස් කිරීම, ඒවාට එකතු කිරීම, සංශෝධනය කිරීමක් හෝ අවලංගු කිරීම නොකළ හැක්කේ ය.

කෙසේ වෙතත් සංස්ථාවේ විධායක සභාව අනුමත නොකරන්නේ නම් එවැනි වෙනස් කිරීමක්, එකතු කිරීමක්, සංශෝධනයක් හෝ අවලංගු කිරීමක් බල රහිත වන්නේ ය.

**6.** (1) සංස්ථාවේ විධායක සභාව විසින් සංස්ථාවේ ආදායම හා වියදම පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය. සංස්ථාවේ ගිණුම්

(2) සංස්ථාවේ විධායක සභාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් විගණනය කළ යුතු ය.

(3) මේ ඡේදයේ "සුදුසුකම්ලත් විගණකවරයා" යනු-

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වන පුද්ගලයකු හෝ නීත්‍යානුකූල ස්ථාපිත කරන ලද එවැනි ආයතනයක විධායක සභාව මගින් ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියේ නිරත වීම සඳහා සහතිකයක් ලබාගත් අයෙකු; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීත්‍යානුකූලව ස්ථාපිත එවැනි වෙනත් ආයතනයක විධායක සභාව මගින් ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියේ නිරත වීම සඳහා සහතිකයක් ලබාගත් නේවාසික කොටස්කරුවන්ගෙන් යුත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක්,

දේපළ අත්පත් කර ගැනීමට හා අරමුදල් රැස් කිරීමට සංස්ථාව සතු බලය

**7.** (1) මිලදී ගැනීමෙන්, ත්‍යාග මගින්, උරුම වශයෙන් පවරා ගැනීමෙන්, ප්‍රදානයන් මගින්, අන්තිම කැමැත්තක් මගින් පවරා දීමකින්, මාරුවකින් හෝ වෙනත් යම් ආකාරයකින් දේපළ අත්පත් කර ගැනීමටත්, වෙනයම් හෝ චංචල හෝ නිශ්චල දේපළ දැරීමටත්, එවැනි අත් කර ගත් හා දරන දේපළ බැහැර කිරීමටත් සංස්ථාවට බලය හා හැකියාව ඇත.

(2) සංස්ථාවේ පරමාර්ථයන් ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍යවන මුදල් කිනම් හෝ ඇපයක් මත ණයට ගැනීමට හෝ රැස්කිරීමටත් සුදුසු යැයි සිතන පරිදි සංස්ථාවේ ණය හෝ බැදීම් ගෙවා නිදහස් වීමටත් සංස්ථාවට බලය ඇත.

(3) සංස්ථාව විසින් මුදලින් හෝ භාණ්ඩ මාර්ගයෙන් අරමුදල් රැස්කිරීම හා සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාගන් සහ ත්‍යාගයන් ලබා ගැනීම කළ හැකි ය.

(4) සංස්ථාව මගින් අත්කර ගන්නා ලද හෝ ඒ සතුව ඇති චංචල හෝ නිශ්චල දේපළ සහ මෙම පනත හෝ රීති යටතේ සංස්ථාවට ගෙවනු ලබන හෝ ලැබෙන සියලු මුදල් තබා ගැනීම, පාවිච්චි කිරීම හා යොදා ගැනීම සංස්ථාවේ රීතිවලට අනුකූලව සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය සඳහා විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

**8.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ලේකම් භාරයේ තබනු ලබන අතර, සභාපති හේ සංස්ථාවේ පවතින රීතිවලින් විධිවිධාන සලසා ඇති තැනැත්තකු ඉදිරියේ මිස කිසියම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔහු විසින් තමන් ඉදිරියේ එකී මුද්‍රාව තබන ලද බවට සලකුණක් වශයෙන් එහි තම අත්සන යෙදිය යුතු ය. තව ද, එම අත්සන් කිරීම කිසියම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ අරමුදල

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා හෝ උරුමයක්, පරිත්‍යාගයක්, සම්මාදමක්, ආධාරයක්, ගාස්තුවක් හෝ ආධාර මුදලක් වශයෙන් ලැබෙන සියලුම මුදල් සංස්ථාවේ විධායක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලුම මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ ආදායම සහ දේපළ යෙදවිය යුතු ආකාරය**

**10.** කවර ආකාරයකින් හෝ ලැබුනාවූ සංස්ථාවේ ආදායම් සහ දේපළ මෙහි දක්වා ඇති පරිදි හුදෙක්ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් යොදා ගනු ලැබිය යුතු අතර, ඉන් කිසිම කොටසක්, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් ආකාරයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට ගෙවීම් හෝ පැවරීම් හෝ කරනු නොලැබිය යුතු ය.

**ආයතනයෙන් ගෙවිය යුතු හා ආයතනයට අයවිය යුතු ණය**

**11.** මේ පනත ක්‍රියාත්මක කරවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැති සංගමයේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරන ලද සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, ඒ දිනයේ දී සංගමයට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

**සංස්ථාවේ සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම**

**12.** සංස්ථාවේ කිසිදු සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා, ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු වාර්ෂික සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

**විසුරුවා හැරීමේදී ශේෂවන දේපළ**

**13.** සංස්ථාව විසුරුවා හැරීමේ දී සියලුම ණය බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ශේෂ වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක්, දේපළක්, ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට එම දේපළ දීම, පැවරීම කරනු ලැබිය යුතු ය. එවැනි ආයතනයක් හෝ ආයතන විය යුත්තේ සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට ආසන්නයේ දී සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලබන පරිදිය.

**ජනරජයේ හෝ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගේ සහ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.